**වාවකච්චේරි නගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

----------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | ඊළඟට ඉදිරිපත් කෙරෙන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කෙරේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.2,375,313 ක් වටිනා යන්ත්‍ර 67 ක්, රු.1,687,954 ක් වටිනා මෝටර් රථ 23 ක්, රු.701,391 ක් වටිනා ලී බඩු 1,097 ක්, රු.1,066,181 ක් වටිනා පුස්තකාල පොත් අවසන් ගිණුම්වල ඉදිරිපත් කර තිබූ නමුත් භෞතික වශයෙන් දක්නට නොවීය. | සියළුම වත්කම් සම්බන්ධයෙන් නියමිත ලේඛන පොත්පත් පවත්වාගෙන යායුතු අතර භෞතික වශයෙන් වන පැවැත්ම ද තහවුරු කළ යුතු වේ. | රු.2,375,313 ක් වටිනා වත්කම් අවසන් ගිණුම්වල ඉදිරිපත් කර ඇත. ඒවා භෞතිකව දක්නට නොමැති වීමෙන් පොත්වලින් කපා හැරීමට කටයුතු කෙරේ. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | නගර සභා මූල්‍ය රීති මාලාවේ III පරිච්ඡේදයේ 54 (3) වගන්තිය | හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | නියමිත නගර සභා මූල්‍ය රීතීන්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන උතුරු පළාත් සභා මූල්‍ය චක්‍රලේඛය | සභාවේ වාහන 10 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | නියමිත චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,145,188 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 37,563,976 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018<br>ඇස්තමේන්තු ගත ආදායම | 2018<br>බිල්කළ ආදායම | 2018<br>රැස්කළ ආදායම | 2018<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017<br>ඇස්තමේන්තු ගත ආදායම | 2017<br>බිල්කළ ආදායම | 2017<br>රැස්කළ ආදායම | 2017<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,936,400 | - | 7,053,963 | 11,824,334 | 7,204,000 | - | 7,125,455 | 11,075,392 |
| (ii) | කුලී | 14,314,200 | - | 26,854.257 | 831,479 | 23,991,200 | - | 26,409,694 | 870,290 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 806,100 | - | 872,031 | 1,500 | 783,000 | - | 643,160 | 19,550 |
| (iv) | වෙනත් ආදායම් | 91,362,000 | - | 50,776,185 | 9,053,738 | 69,361,400 | - | 70,581,370 | 3,889,975 |
| | එකතුව | 113,418,700 | - | 85,556,436 | 21,711,051 | 101,339,600 | - | 104,759,679 | 15,855,207 |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.104,759,679 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.85,556,436 ක් වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.19,203,243 කින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. සභාව විසින් බිල් කළ ආදායම් දෙසැම්බර් 31 දිනට පැවැති හිඟහිටි ප්‍රමාණය තහවුරු කරගත නොහැකි වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ හිඟ වරිපනම් බදු රු.11,824,334 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් නියමිත කාලයේදී අයකර ගත යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කෙරේ. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු.831,479 ක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සභාව විසින් හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කෙරේ. |

### 2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ රු.25,400 ක් වටිනා සන්නිවේදන කුළුණු බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සන්නිවේදන කුළුණු බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහනගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සුවය පහසුකම් සහ සුභසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 15 පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා මූලික කරුණු 15 ක් සඳහාම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කරගෙන නොතිබුණි. | අදාළ ආඥා පනතේ 157 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 15 පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 15 ක් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 15 ක් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | මෙම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පිළිසරු ව්‍යාපෘතියෙන් ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය ඉදිකර තිබුණත් සභාව සතු ඇඹරීමේ යන්ත්‍ර සවි නොකර අනාරක්ෂිතව ප්‍රධාන කාර්යාලයේ දක්නට ලැබුණි. | සභාව සතු වත්කම් නියමිත පරිදි භාවිතා කළ යුතු වේ. | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ii) | 2016 වර්ෂයේ පිළිසරු ව්‍යාපෘතියෙන් ලැබූ මුදල් රු.66,968 ක් උපයෝජනය කර නොතිබුණි. | ලැබූ අරමුදල් අදාළ අරමුණ සඳහා යොදාගත යුතු වේ. | මෙම මුදල් අදාළ අරමුණු සඳහා යෙදවීමට කටයුතු කර ඇත. |
| (iii) | ප්ලාස්ටික් බෝතල්, පොලිතීන් බෑග්, වීදුරු භාණ්ඩ ආදිය එකතු කර වෙන්කර තිබුණත්, ඒවා ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලියට භාජනය කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණයට භාජනය කළ යුතු වේ. | අදාළ ක්‍රියා මාර්ගගෙන ඇත. |

**(ඈ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් පිළිබඳ ක්‍රියාමාර්ග සිදු කළ යුතු වේ. | අපද්‍රව්‍ය බැහැර කරන ප්‍රදේශවල මදුරුවන් බෝවීම වැලැක්වීමට වහාම කටයුතු කෙරේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ට්‍රැක්ටරයක්, වතුර බවුසර් 02 ක් 2016 වර්ෂයේ සිට භාවිතයෙන් තොරව පැවතුණි. | වාහන නිසි පරිදි අවශ්‍යතාවයට අනුව භාවිතා කළ යුතු වේ. | ට්‍රැක්ටරය භාවිතා කිරිම අවම කිරීමටත් වතුර බවුසර් 02 හි වටිනාකම පොත්වලින් කපාහැරීමටත් කටයුතු කෙරෙමින් පවතී. |
| (ආ) | රු.67,328,710 ක් වටිනා ස්ථාවර තැන්පතු මුදල් නගර සංවර්ධනය සඳහා යොදවා නොගෙන පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | සභාවේ අරමුදල් නගර සංවර්ධනය සඳහා උපයෝජනය කළ යුතු වේ. | ස්ථාවර තැන්පතුවලින් සිදුකළ යුතු ව්‍යාපෘති ඉටුකිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් අවශ්‍ය මානව සම්පත් ලබාගෙන යොදවාගෙන නොතිබීමෙන් එවැනි මානව සම්පත් 22 කගෙන් ඉටුවිය යුතු සේවාවන් ප්‍රමාද වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | සභාවෙහි මියගිය, වැඩ තහනමට ලක් වූ සේවකයින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ සේවක ණය රු.96,668 ක් අයකිරීමට පසුගිය වර්ෂ හතකට අධික කාලයක සිට කටයුතු කර නොතිබුණි. | ණය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. | හිඟ සේවක ණය කපා හැරීමට කටයුතු කරමින් පවතී. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සේවකයින් තිදෙනෙකුට අයත් සේවක අර්ථසාධක අරමුදල් අදාළ අයට නොගෙවා තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. | සේවක අර්ථසාධක අරමුදල් අදාළ අයට ගෙවිය යුතුය. | මෙම අරමුදල් අදාළ අයට ලබාදීමට කටයුතු කෙරේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තු කිරීම හා අලුත්වැඩියාවන් කිරීමට අපොහොසත් වීම**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක WDRB-4214 දරන ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම සඳහා ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලැබී තිබුණත් අලුත්වැඩියා කර නොතිබුණි. | වාහන සඳහා නියමිත කාලපරිච්ඡේදයේ අලුත්වැඩියාවන් සිදුකළ යුතු වේ. | මෙම ට්‍රැක්ටරයේ උපයෝජනය අවම කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | අංක EPJP – 8201, EPJS – 7934 දරන වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන සඳහා නියමිත කාලපරිච්ඡේදයේ අලුත්වැඩියාවන් සිදුකළ යුතු වේ. | වාහන දෙකම පොත්වලින් කපා හැරීමට කටයුතු කෙරෙමින් පවතී. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් වන ගමන් වියදම්, මූලධන වත්කම් අලුත්වැඩියා, සහනාධාර හා උපකාරක මුදල්, විශ්‍රාම වැටුප් ආදිය තථ්‍ය වටිනාකමින් විශාල ප්‍රතිශතයක් ඉතිරි වී පැවතුණි. මේ නිසා අයවැය ඵලදායී නොවන එකක් ලෙස සැලකුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කර ඵලදායී පාලන කාරකයක් ලෙස සලකා කටයුතු කිරීම අවශ්‍ය වේ. | පිළිතුරු ලබා දී නොමැත. |